කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

# දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව

## 2024 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම පිණිස **2024.03.03** දින සිට **2024.04.03** දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම සිදු කෙරේ.

දෙමළ භාෂාවේ, කථා කිරීම, ලිවීම, අවබෝධය හා පරිවර්තනය කිරීම පිළිබඳ දැනුමක් ලබා එම භාෂාව භාවිත කිරීමට මෙන්ම දෙමළ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අපේක්ෂා කරන අය වෙනුවෙන් මෙම පාඨමාලාව විශේෂයෙන්ම සකස් කර ඇත. **2024 මැයි මස සිට මෙම පාඨමාලාවේ දේශන ආරම්භ කිරීමට නියමිත ය.**

**පාඨමාලා කාලය** අධ්‍යයන වර්ෂ එකකි.

(සෙනසුරාදා සහ ඉරිදා දිනවලින් එක් දිනයක් පමණක් තෝරා ගත යුතුය. දේශන කැලණිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැවැත්වේ. දේශන කිහිපයක් පමණක් මාර්ගගත(online) ක්‍රමයට පැවැත්වේ.)

**පාඨමාලා ගාස්තුව** රුපියල් 60,000කි. (රුපියල් හැටදහසකි)
පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැකිය.
(පළමු වාරිකය රු. 32,000/- සහ දෙවන වාරිකය රු.28,000/-)

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්** අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනකින් සමත්වීම

හෝ

ඒ හා සමාන සුදුසුකම්

හෝ

සේවා අවශ්‍යතාව මත වසර 10ක සේවා පළපුරුද්ද

**අයදුම්පත්‍ර ගාස්තුව** රුපියල් 750.00 කි. මෙම ගාස්තුව මාර්ගගත(online) අයදුම්පත්‍රය පුරවා අවසානයේ ලැබෙන රිසිට් පතෙහි සඳහන් ගිණුම් අංකයට ගෙවිය යුතුය.

**අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය සහ යොමු කරන ආකාරය**

https://hu.kln.ac.lk/depts/linguistics/index.php/tamil-diploma-2024

යන වෙබ් ලිපිනයට පිවිස පාඨමාලා අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

බාගත (download) කර ගත් අයදුම්පත්‍රයේ පිටපතක් (Printout) සමග

1. උප්පැන්න සහතිකයේ පිටපතක්
2. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
3. උසස් පෙළ විභාග සහතිකයේ පිටපතක්
4. මහජන බැංකුවට රු. 750.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට් පත හෝ online ගෙවීම් වවුචරය සමග අමුණා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. **"සම්බන්ධීකාරක, දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"**.

(0112-908786 යන දුරකථන අංකය ඇමතීමෙන් අයදුම්පත්‍ර සම්බන්ධයෙන් වැඩි විස්තර දැන ගැනීමට හැකිය.)

බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ මත ප්‍රමුඛතාව හිමි වේ.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2024.03.03